# අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016
## සිංහල I පත්‍රය

1. (අ) (i) මනහර රූපයකින් ද කෙළි ලොල් ගති ලක්ෂණවලින් ද යුක්ත සොළොස් හැවිරිදි වයසේ යෞවන තැනැත්තියක ලෙස ය.

(ii) කුලයෙන්/වංශයෙන් හා සම්පත්වලින් සමාන අයෙකු විවාහයට තෝරා ගැනීම.

(iii) යෝජිත සිටුපුත්‍රයා හා විවාහ වුවහොත් ඔවුන් දෙදෙනාට කිසිසේත් ම යළි දකින්නටවත් අවස්ථාවක් නො ලැබෙන බව

(iv) මිථ්‍යාචාරයෙන් - වැරදි හැසිරීමෙන්/නොමනා හැසිරීමෙන්
ඔබ නොයන තෙක් - එහි යාමට පෙර **(ලකුණු 04)**

(ආ) (i) හෙතෙම රිදී පර්වතයක් සේ සුදු පැහැති ශරීරයකින් යුක්ත ය ; ලතු පැහැයෙන් යුත් මුඛයක් හා පාදවලින් යුක්ත ය ; රියන් අසූඅටක උසින් හා රියන් එකසිය විස්සක දිගින් යුක්ත ය ; රියන් පනස් අටක් දිග හොඬවැලකින් හා රියන් තිහක් දිග රැස් විහිදුවන දළ සඟලකින් සමන්විත වන අතර දළ සඟළෙහි වට ප්‍රමාණය රියන් පහළොවකි.

(ii) අවශේෂ ඇතුන් පිරිවරා ගෙන ගොස් පසේ බුදුවරුන්ට පූජා පැවැත්වීමෙන්

(iii) සෘද්ධි බලයෙන් ආකාශයෙහි ගමන් කිරීමට හැකි වීම.

(iv) සදත්දහතලා - ඡද්දන්ත විල
යූථපති - රංචුවේ / රැළේ / කණ්ඩායම් නායක **(ලකුණු 04)**

(ඉ) (i) මිනිසුන් රාජකුමාර මාලිගයට ගෙන ගිය වස්තුව පිර වූ ගැල් අදින ගොනුන් කුමරු සිල් සමාදන් ව සිටි ඉසුරුමුණි විහාරය අසල දී නතර වීම.

(ii) අනුරාධපුර රාජකුමාර මාලිගයට

(iii) දිවියකු අතින් ගැළ වී මවක කරා දිවෙන වසු පැටවෙකු සේ

(iv) අයමුඛය - අයබදු
පෝසථාඞගශීලය - උපෝසථ දිනයේ සමාදන් වූ ශීලය/අටසිල් **(ලකුණු 04)**

(ඊ) (i) පබළු, මුතු, මැණික් ආදියෙන් තැනූ ආභරණ පැළඳ ගෙන
(ii) කනා ලියන් (රන්වැල්) සුන්දර වූ දලු, කොළ, මල්, පල ආදියෙන් සැදුම් ලත් සෙයින් ම පුරඟනන් ද පබළු, මුතු, මැණික් ආදියෙන් තැනූ අබරණ පැළඳ සිටිති.
(iii) පුරකතුන්ගේ පියයුරුවලට පරාද වීම නිසා
(iv) උත්ප්‍රේක්ෂාලංකාරය **(ලකුණු 04)**

(උ) (i) සම්බුලා ජාතකයෙහි ඇතුළත් පාඨයකි. සම්බුලා බිසව සොත්ථිසේන රජුගේ වෙනස් වීම නිසා තම සිතෙහි වූ සන්තාපය සිය මාමණ්ඩිය වූ තාපසයාණන්ට ප්‍රකාශ කිරීමෙන් අනතුරු ව ඔහු සිය පුතා වූ සොත්ථිසේන අමතා මෙසේ අවවාද දෙයි.

(ii) සද්ධර්මරත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටාණන්ගේ කතා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. කබලු කෑමේ ආශාවෙන් ඇඳෙහි වැදහොත් සිටාණන්ගෙන් මාලිගයෙහි සිටින පිරිසට ඇති වන්නට කබලු පිසින්න දැයි ඇඹෙණිය අසන විට ඔහු මෙසේ පිළිතුරු දෙයි.

(iii) සද්ධර්මාලංකාරයේ ශාලිරාජ කතාවස්තුවෙන් උපුටාගත් පාඨයකි. අශෝකමාලාවගේ කුශලය පෙන්වනු පිණිස දේවතා දුව ගෙනා බෙහෙත් කැඳ සැළියට ශාලිරාජ කුමරා සිනාසෙන විට අශෝක මාලා කැඳෙහි ආනුභාව දක්වමින් ඔහු අමතා කරන ප්‍රකාශයකි.

(iv) සත්ගුණවත් සාමෙල් කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. සාමෙල්ගේ මරණයට හේතුව ලයනල් රාලහාමි පැහැදිලි කරන අවස්ථාවේ කථකයා කරනු ලබන ප්‍රකාශයකි.

2 වන පිටුව බලන්න

(v) මළගිය ඇත්තෝ නවකතාවෙන් උපුටා ගත් පාඨයකි. කියොතෝ යාමට සූදානම් ව සිටින දෙවෙන්දොරා සං නොරිකෝ සං සමග විසිතුරු බඩු විකුණන සාප්පුවකට ගොස් සිහිවටනයක් මිලට ගෙන ඇයට දෙයි. එවිට නොරිකෝ තමාගේ සිහිවටනය ඔහුට දෙමින් මෙසේ පවසයි.

(vi) රත්නාවලී නාට්‍යයෙන් උපුටාගත් පාඨයකි. කෙසෙල් උයනේ දී සාගරිකා හා රජුගේ සිතුවම් සහිත පුවරුව විදූෂක අතින් ගිලිහී බිම වැටෙන විට එය දකින වාසවදත්තා දේවිය රජුට කරන ප්‍රකාශයකි.

**(ලකුණු 08)**

(ඇ) කවි පෙළ රසාස්වාදයේ දී කවියා යොදා ගත් ආකෘතිය මෙන් ම අන්තර්ගතය කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය. ආකෘතිය යටතේ කවියා යොදා ගත් රිද්මයානුකූල පද මාලාව, ශබ්ද ධ්වනි ආදිය කෙරෙහි අවධානය යොමු විය යුතු ය. අන්තර්ගතය යටතේ කවිපෙළින් හෙළි වන කරුණු පිළිබඳ විමසීමක් කළ යුතු ය. මෙහිදී උපමා රූපක හා සංකේත භාවිතය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

කවි පෙළෙහි වස්තු විෂය වන්නේ සාම්ප්‍රදායික වැඩවසම් සමාජය බිඳ වැටී විකල්පයක් වශයෙන් නව ගොවි සමාජය පෙරට එන ආකාරයයි. මෙහි දී වලව්ව ක්‍රමයෙන් ජරාවාස වීම සංකේතයක් ලෙස යොදා ගෙන ඇත. කථකයා වැඩවසම් සමාජ පරම්පරාවක අවසාන පුරුක වන බවක් පාඨකයාට හැඟේ. එසේ ම සිදුවන මෙම පෙරළිය ආස්වාදනීය අත්දැකීමක් වන බව ද පාඨකයාට හැඟේ.

මෙතෙක් කලක් රදළ හාම්පුතුන්ගෙන් පීඩාවට පත් වූ දිළිඳු ගැමියන් ලබන මානසික නිදහසත්, ආර්ථික නිදහසත් කවි පෙළෙන් ගම්‍ය වේ.

රූපකාර්ථවත් යෙදුම්, ව්‍යංග්‍යාර්ථ, සංකල්ප රූප, සංකේත ආදියෙන් ද කාව්‍යෝක්තිවලින් ද පද්‍ය පන්තියට සිදු වී ඇති මෙහෙය පිළිබඳ ව විමසා බැලිය යුතු ය.

උදා : පරපුරක කළු දුඹුල්
සෙවෙල කෑ උළු පිහිලි
අලුත් වැස්සක අසිරි
ඇවිත් නිල්දිය ඉසින
මහ පෙට්ටගම හායි ගා මහලු කට අරින
ඇදුරු වුණු දොර ජනෙල මානයේ උණුසුමින
මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන

මෙහි සෑම පද්‍යයක ම අවසානය සමාන අක්ෂරවලින් යෙදේ. එසේ ම රිද්මයානුකූල ව ගායනා කළ හැකි නිර්මාණයක් වන අතර ම වැස්සෙහි ස්වරූපය හා සමාජ පරිසරයේ ස්වරූපය ද පැවසීමට යෝග්‍ය වන ආකාරයෙන් භාෂාව සැකසී ඇත.

**(ලකුණු 16)**

2. නියමිත කතාවස්තු ඇසුරෙන් විවිධ පුද්ගලයන්ගේ චර්යා නිරූපණය කිරීම විමසා බැලීම මෙහි දී අපේක්ෂිතයි. ඒ අනුව පහත දැක්වෙන චරිත හා සම්බන්ධ අවස්ථා පිළිබඳ ව අවධානය යොමු විය යුතු ය.

**පටාචාරා කතාවස්තුව**
සිටු දියණිය දාසයකු හා මිත්‍ර වී සිටු මැඳුරෙන් පලායාම, ජීවත් වීමට දරන වෙහෙස, සැමියා හා දරුවන් අහිමි වීම, උමතුභාවයට පත් වීම, බුදුරජාණන් වහන්සේගේ පිළිසරණ ලැබීම.

**මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව**
සිටාණන් කැවුම් කෑමේ ආශාව සිතේ සඟවා ගෙන දුක් විඳීම, ඇඹෙණිය හා සිටාණන් අතර සිදුවන කතාබහ, මුගලන් තෙරුන් දුටු විට සිටාණන් හැසිරෙන ආකාරය, බුදුන් වහන්සේට කැවුම් පූජා කිරීම. **(ලකුණු 15)**

**නැතහොත්**

පරිසර වර්ණනය කෙරෙහි ජාතක කතාකරුවා ඇදී යන ආකාරයත්, එමගින් ඔහුගේ නිර්මාණ ශක්තිය හෙළි වීමත් මෙහි දී කතාවස්තු දෙකක් ඇසුරින් විමසා බැලිය යුතු ය.

උදාහරණ ලෙස ඡද්දන්ත ජාතකයේ අටළොස් වනගහන හා සදත්විල පිළිබඳ ව ඉදිරිපත් කෙරෙන වර්ණනා ද, සම්බුලා ජාතකයේ ආශ්‍රම භූමිය අවට වනය පිළිබඳ ව ඉදිරිපත් කෙරෙන වර්ණනා ද පිළිතුරට ඇතුළත් විය යුතු ය.

**(ලකුණු 15)**

3 වන පිටුව බලන්න

3. * වරදට පෙලඹීම හා වැරදිවලට සමාව දීම මගින් මනුෂ්‍ය ස්වභාවය නිරූපණය කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා උත්සාහ ගත් ආකාරය නියමිත කතා ඇසුරෙන් දැක්වීම මෙහි දී අපේක්ෂිත ය.

* ශාලිරාජ කතා වස්තුවේ දී ශාලිරාජ කුමරා ක්ෂත්‍රිය වංශයට අනුගත සම්ප්‍රදායන්ට එරෙහි වෙමින් අශෝකමාලාව සරණ පාවා ගැනීමත්, පසු ව දුටුගැමුණු රජතුමා හා අමාත්‍යයන් ඇගේ ගුණ සලකා කුමරුට ආශිර්වාද කිරීම මෙන් ම

* ආරඤ්ඤක අභය කතා වස්තුවේ දී හරන්තික හොරා කළ වරදට දඬුවම් ලැබූවත් තෙරුන් වහන්සේගේ කරුණාවට පාත්‍ර වී මාර්ග පල ලැබීම ආදී කරුණු පිළිබඳ ව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

**(ලකුණු 15)**

4. ගිරා සංදේශ කතුවරයා තම අදහස් තහවුරු කිරීම සඳහා බෞද්ධ හා හින්දු සාහිත්‍යාගත තොරතුරු දැක්වීම නිදසුන් හතරක් මගින් විමර්ශනය කිරීම අවශ්‍ය වේ.

ඒ සඳහා පහත දැක්වෙන පද්‍ය පිළිබඳ අවධානය යොමු කර තිබීම අවශ්‍ය ය.

**බෞද්ධ සාහිත්‍යාගත තොරතුරු :**

05. දිරා වැටෙන තුරු තුර නොහැර ඉඳ තොසේ
පුරා තනෙහි පරසිඳු මුළු තෙදිය කුසේ

08. හිම සෙල් අතර කෙළලක් රකුසන් විසිනි
රැකවල් කළ කුවෙර අබතුරු අඹ තුරිනි

09. බඹදත් රද රදුන් හට විස යෙදූ සඳ
එපවත් අසා සෙද සෙබළුන් යවා තද

17. සඳ රිවි තමන් රහුමුව පත් වූ සඳෙහි
බිඳ ගණ අඳුර එළිකරනුව රැ දෙවෙහි

67. වස වතු දප් බිඳ බුදු වූ ගුණ නදන
අප දිය බප් මුනිඳා ගැබ කර නදන

96. පළඟ ගහන කළ සඳ විහිදුණු විසද
සමඟ කලා වැද නො හැසුණු මැද හිරද

153. මනු නීති දස රද
දහමින් ලොවට අග රද

154. ස සමය දැන පැවති
මිලිඳු රජු සේ විය දැනුමැති

229. රුදුව සෙනඟ ගෙන ආ වසවතු යුදට
මුදුව බිණු තෙපලෙන් ජය ගෙන ලොවට

**හින්දු සාහිත්‍යාගත තොරතුරු :**

03. ලද යම් කෙනෙක් සරසවි බැලුමසක් නිසි
කොතරම් වුවත් මුළු ලොව කෙරෙහි අතවැසි

11. හරගිරි රසිනුදුළ - දිනිසුරු අලකපුර යුරු

14. බඹා පළමුවෙන් ලොව පමණ නො දැනමා
අඹා තිබූ සක්වළ ගිරි සෙ මෙ තැන මා

50. පෙර උවිදා ගෙන ගිරිදා කිරි සයුර
කළඹනදා නැගි නොමඳා ගොස අයුර

69. හර දළ නෙතග වන් - හිවි තව තෙදින් බබළන

82. වියොවග ලෙළ දද සිරි කියෙළීයා

93. අවර ඇදුරු මෙහෙසුරු හිමි දළ නෙතින
නොහැර දිනත දින මින්දදහු වෙසෙසින

114. පෙර තම තම නුගත්
රාම සීතා කතා තෙපලත්

137. තෙවිකුම් විකුම් ඇති
අප හිමි දිනිඳු කුලපති

215. නරන සකොබ කළ සඳ නොව ලසේයා
කිරණ පිඬුව දිසි අමරස ලෙසේයා

241. තිවට කසුබු ඉසි සුරගුරු මෙන් සුබද
ලොවට කලණ ඒ යති සඳුගේ නොමඳ

247. බුන් නරගහු තව තෙදණහු සරි රජහු
සුර ඇදුරුහු හැර කවරහු වනති ඔහු **(ලකුණු 15)**

5. පුද්ගලයන් අපේක්ෂා භංගත්වයට පත් වීම නිසා මතු වන ප්‍රශ්න නිරූපණය කිරීමට මළගිය ඇත්තෝ නව කතාවේ කතුවරයා යොමු වී ඇති ආකාරය දැක්වීම මෙහි දී අපේක්ෂා කරන අතර, අදාළ අවස්ථා හතරක්වත් නිදසුන් ලෙස ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

දෙවෙන්දොරා සං කියොතෝ යාමට සූදානම් වීම, ආපසු තෝකියෝවට පැමිණීම, නිදිපෙති පානය කරමින් සිය දිවි නසා ගැනීමට තැත් කිරීම, නොරිකෝගේ විවාහ යෝජනාව බිඳ වැටීම, නිශ්චිත තීරණයකින් තොර ව ඔහු ලංකාවට පැමිණීම හා එහිදී ක්‍රියා කරන ආකාරය, නොරිකෝ ගෙන්වා ගැනීම පිළිබඳ සැලැස්මක් නොමැති වීම හා නොරිකෝගේ අවිනිශ්චිත හැඟීම් යනාදිය නිදසුන් ලෙස දැක්වීම අවශ්‍යය. **(ලකුණු 15)**

6. තාත්තා කෙටි කතාවේ දී පියපුතු සෙනෙහසේ ස්ථාවරත්වය සංවේදී ස්වරූපයකින් ඉදිරිපත් කිරීම මෙහි දී විමර්ශනය කළ යුතු වේ. ඒ සඳහා පහත දැක්වෙන නිදසුන් අදාළ කරගත හැකි ය.

ළමා කාලයේ සිදුවීම් ඇසුරෙන් කථකයා තුළ පියාගේ සෙනෙහස ස්ථාවරත්වයට පත් වීම, කථකයාගේ අධ්‍යාපනය වෙනුවෙන් පියාගේ දේපළ අහිමි වීම, පියා රැකබලා ගැනීමේ අදිටන හා සුමනාගේ ක්‍රියාකලාපය හමුවේ ආවේගශීලී ව කටයුතු කිරීම, බිරිඳගෙන් වෙන් වීම හා තාත්තා සිහිපත් කිරීම. **(ලකුණු 15)**

7. නූතන කවීන් තම අදහස් විචිත්‍රවත් කිරීමට සංකල්ප රූප භාවිත කළ ආකාරය නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් විමසා බැලීම මෙහි දී අපේක්ෂිතයි. සංකල්ප රූප යටතේ වචන හා අදහස් භාවිතය මගින් පුද්ගල මනසෙහි විචිත්‍රත්වයක් ඇනවීම අපේක්ෂා කෙරේ.

කවියා යොදා ගත් උපමා, රූපක, සංකේත ආදිය ගැන ද මෙහි දී සලකා බැලීම අවශ්‍ය ය. ඒ සඳහා පහත දැක්වෙන කාව්‍ය නිර්මාණ සහ අදාළ වෙනත් නිර්දිෂ්ට කාව්‍ය ගැන ද අවධානය යොමු කිරීම සුදුසු ය.

නිදසුන් පද්‍ය - අන්ධ කවියා, පරිණාමා, ලීස්තර වැට, අම්මා, රුව දැකීම, දෙදෙනාම දියණියෝ, සුරා සොඬ සැමි වලප, දිවා භෝජනය **(ලකුණු 15)**

8. විදූෂක චරිතය රත්නාවලී නාට්‍යයේ විශේෂ ස්ථානයක් ගනී. හාස්‍ය රසය ජනනය කිරීම, චරිත හඳුන්වා දීම, කතා වස්තු විකාශනය ආදිය කෙරෙහි මෙම චරිතය මගින් බලපෑමක් සිදු කෙරේ. එහි දී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු වේ.

විදූෂක, රජුගේ සිතෙහි සාගරිකා පිළිබඳ ව ඇතිවන ප්‍රේමයට අනුබල දීම, රජු හා සාගරිකා අතර හමුව සැලසුම් කිරීම, ඉන්ද්‍රජාලිකයා ලවා අන්තඃපුරයේ ගින්නක් මවා පෑම, සාගරිකාගේ මැණික් මාලය පැලඳ ගෙන සිටීමෙන් එම මාලය කෙරෙහි ඇමතිවරුන්ගේ අවධානය යොමු කරවීම. **(ලකුණු 15)**

## අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016
## සිංහල II පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1.1 | 4 |
| 1.2 | 2 |
| 1.3 | 1 |
| 1.4 | 5 |
| 1.5 | 1 |
| 1.6 | 2 |
| 1.7 | 1 |
| 1.8 | 4 |
| 1.9 | 5 |
| 1.10 | 3 |
| 1.11 | 1 |
| 1.12 | 5 |
| 1.13 | 1 |
| 1.14 | 4 |
| 1.15 | 3 |
| 1.16 | 2 |
| 1.17 | 4 |
| 1.18 | 5 |
| 1.19 | 4 |
| 1.20 | 1 |

**(ලකුණු 20 යි)**

The National e-learning Portal for The General Education

6 වන පිටුව බලන්න

2. (අ) (i) පරමාණු වැනි ඉතා සියුම් මට්ටටමක දී ද්‍රව්‍යවල අන්තර්ගතය වෙනස් කිරීමෙන් එහි ආවේණික ගති ලක්ෂණ වෙනස් කිරීම.

(ii) කර්මාන්ත අංශයේ විවිධ ක්ෂේත්‍රවල

(iii) සාමාන්‍ය රෙදිපිළි, දියර හා වෙනත් ද්‍රව්‍ය උරා නොගන්නා රෙදිපිළි බවට පත් කිරීම.

(iv) *බිත්ති පිරිසිදු කිරීමට තීන්ත වර්ගයක් නිපදවීම.
*අපද්‍රව්‍ය නො රැඳී ඉබේ පිරිසිදු වන වීදුරු වර්ගයක් නිපදවීම.

(v) හතරකි. **(ලකුණු 2×5= 10යි)**

(ආ) * කලාපීය ගුවන් කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ඉස්මතු වීමට උත්සාහ දැරීම.
* සංචාරක කටයුතු සඳහා ගුවන් පහසුකම් සැපයීම.
* ගුවන් යානා නැවැත්විය හැකි ස්ථාන සහ විනෝදාත්මක ගුවන් පහසුකම් සැපයීම.
* තරගකාරී ව්‍යාපාරික පරිසරයක් සැපයීමට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම.
* රජයේ සහ ගුවන් කර්මාන්තයේ නියැලෙන වෙනත් පාර්ශ්ව සමග සහයෝගිතාවක් ඇති කිරීම.
* පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා මානව සම්පත්වලට අදාළ ගැටලුවලට පිළියම් යෙදීම. **(ලකුණු 15යි)**

3. රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.
* රචනය සඳහා තෝරාගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.
* ඒ කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
* කරුණුවල පැහැදිලි බව හා නිරවද්‍යභාවය
* නිවැරදි අක්ෂර වින්‍යාසය අනුගමනය කිරීම
* ව්‍යාකරණ දෝෂ රහිත වීම
* භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
* සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
* කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම
* විවිධ භාෂාත්මක අංග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකිය)

**වචන සංඛ්‍යාව අඩුවීම හෝ වැඩිවීම හෝ ලකුණු අඩුවීමට හේතුවකි.** **(ලකුණු 25යි)**

4. (අ) (i) චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට රසිකයින් පැමිණෙති'යි මම සිතීමි.

(ii) ආපදාවෙන් විපතට පත් වූවන් බේරා ගැනීමට කිසිවකු ඉදිරිපත් වී නැත.

(iii) නිවැරදි ය.

(iv) අමාත්‍ය මණ්ඩලයේ කෙනෙක් නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ය.

(v) නීතිඥයන් නිවැරදිකරුවන් මුදා හැර වැරදිකරුවන් නීතියේ රැහැනට කොටු කරගත යුතු ය.

**(ලකුණු 10යි)**

(ආ) (i) උසස් අධ්‍යාපන ආයතන විසින් නව වසර සඳහා සිසුහු බඳවා ගැනෙති/ගනු ලබති/ගනු ලබත්

(ii) දෙමවුපියන් විසින් ගුරුවරුන් සඳහා උපහාර උලෙළක් සංවිධානය කරවනු ලබයි./කෙරවෙයි/කරවනු ලබන්නේ ය./කරවනු ලැබේ.

(iii) දේශප්‍රේමීන් විසින් ස්වාර්ථය පතා රටෙහි නීතීහු උල්ලංඝනය නො කෙරෙති/නො කෙරෙත්/නො කරනු ලබති/නො කරනු ලබත්

(iv) රියැදුරකු විසින් මහ මග වැටී සිටි ගැබිනියක් රෝහල් ගත කෙරිණි/කරන ලද්දී ය/කරනු ලැබුවා ය/කෙරුණු.

(v) රටෙහි ජනතාව රකිනු ලබන්නේ රණවිරුවන් විසිනි. **(ලකුණු 05යි)**

(ඉ) (i) කලාවේදීන්

(ii) කිවිඳියන්

(iii) ප්‍රදීපයෝ

(iv) කළාය

(v) කවරෙක් **(ලකුණු 05යි)**

5. (අ) (i) අනුන් පහත් කොට සැලකීම/අනුන් හෙළා තලා කතා කිරීම

(ii) කිසිසේත් යටපත් කළ නොහැකි ලෙස/පරාජය නොවී

(iii) නිරන්තරව යමෙක යෙදීම **(ලකුණු 03යි)**

7 වන පිටුව බලන්න

(ආ) (i) ගගනගාමී/ආකාශචාරී
(ii) මාත්සර්යය
(iii) විජිගීෂාව **(ලකුණු 03යි)**

(ඉ) (i) ආකුල
(ii) ව්‍යාකුල
(iii) තරගාවලියට
(iv) තරඟාවලියට
(v) ව්‍රත
(vi) වෘත **(ලකුණු 03යි)**

(ඊ) (i) මුව - මුහුණ/මුඛය/කෙසෙල් මුව/දොරටුව/මකරන්දය
(ii) තුරු - තාරුකා/නිපාත/තූර්යභාණ්ඩ
(iii) කර - දැලිපිහිය/පූර්වක්‍රියා/විධික්‍රියා/රශ්මිය/කරදිය/පිළිස්සීම
(iv) බල - විධික්‍රියා/මාළු (එනම්)/ශක්තිය
(v) වද - එනම් වූ මල/වදය (මී)/විධානය/බිහිකරනවා/ඇතුල් වෙනවා
(vi) මල - පුෂ්පය/ඉදිකටු සිදුර/කිලුටු/උඟුල **(ලකුණු 06යි)**

6. (අ)

| | | | |
|---|---|---|---|
| (i) | ශිෂ්‍යයන් | නාම පදයකි | - අනුක්ත විභක්ති බහුවචන |
| | පිවිසෙද් දී | ක්‍රියා පදයකි | - කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා |
| | තදින් | අව්‍යය/විශේෂණ පද | - නිපාත/ක්‍රියා විශේෂණ |
| (ii) | දොළහෙන් | නාම පදයකි | - අවධි විභක්ති |
| | භෝජනාගාරය | නාම පදයකි/සන්ධි | - උක්තයකි/ස්වර දීර්ඝ සන්ධි |
| | මිනිසුන්ගෙන් | නාම පදයකි | - කරණ විභක්ති බහුවචන |
| (iii) | වී | ක්‍රියාවකි | - පූර්ව ක්‍රියා |
| | සංසිඳුවා | ක්‍රියාවකි | - පූර්ව ක්‍රියා/නිපාත ක්‍රියා |
| | යළිත් | අව්‍යය | - අවධාරනාර්ථ නිපාත |
| (iv) | රන්පදක්කම | සමාස/නාම පදයකි | - විභක්ති සමාස/කරණ විභක්ති සමාස |
| | උන්මත්තකයෙකු | නාම පදයකි | - කර්ම විභක්ති |
| | මෙන් | අව්‍යය | - උපමා වාචී නිපාත |
| (v) | අගරු | සමාස/විශේෂණ පදයකි | - අව්‍යය සමාස/නාම විශේෂණ |
| | නිෂ්කාශනය | නාම පදයකි/සමාසයකි | - අව්‍යය සමාස |
| | බැංකුකළමනාකරු | නාම පදයකි/සමාස | - විශේෂණ සමාස/උක්තය -ප්‍රථමා විභක්ති |

**(ලකුණු 3 x 5 = 15යි)**

7. (අ) (i) අකලට හටගත් ගෙඩිය
(ii) අටුව කඩු පුටුව සෑදීම
(iii) අත හයිය නම් බත නොවැරදේ
(iv) අතු කඩා මොර කෑම
(v) අනේ කාලේ වනේ වාසේ
(vi) අශ්වයාට අං ලැබීම **(ලකුණු 03යි)**

(ආ) (i) නැවතීමක් නැති
(ii) කිසිසේත් ගැළපීමක් නැති දෙය හෝ පුද්ගලයා
(iii) දෝෂාරෝපණය කිරීම
(iv) අවනම්බු කිරීම/ලැජ්ජාවට පත් කිරීම
(v) නිෂ්ඵල ක්‍රියාවක් කිරීම
(vi) දැඩි පක්ෂපාතී ලෙස යමක් තහවුරු කිරීමට උදවු කිරීම **(ලකුණු 03යි)**

8 වන පිටුව බලන්න

(ඉ) (i) සමානාර්ථවත් පද දෙකක් එකතුවීම
(ii) විරුද්ධාර්ථවත් පදයක් එකතු කිරීම
(iii) අර්ථ විරහිත පද දෙකක් එකතු කිරීම
(iv) අර්ථවත් පදයක් සමග අර්ථ විරහිත පදයක් යෙදීම
(v) එකිනෙකට වෙනස් අර්ථ ඇති පද දෙකක් එකතු කිරීම
(vi) එකිනෙකට ළංවන අර්ථවත් පද දෙකක් එකතු කිරීම **(ලකුණු 03යි)**

(ඊ) (i) වෙලාව
(ii) කට ලොකු මැටි බඳුන
(iii) ප්‍රමාද වෙනවා
(iv) බිව්ව
(v) මහලු තැනැත්තා/වයසක තැනැත්තා
(vi) ගඳ **(ලකුණු 03යි)**

(උ) (i) කමත
(ii) ගොයම් අහුර/කපා ගත් ගොයම් මිටි
(iii) ඇම දමා මාළු ඇල්ලීම
(iv) මුහුදු රළ මඳ වශයෙන් ඉහළ යාම
(v) අකුළනවා
(vi) වී එකතු කරන උපකරණය/කමත අතුගාන උපකරණ **(ලකුණු 03යි)**

**(ලකුණු 3 x 5 = 15යි)**

8. (අ) (i) බටහිර ඉන්දියාවෙන් ලංකාවට සංක්‍රමණය වූ ආර්යයන් රට තුළට ගමන් කොට ඇත්තේත් වාසයට තෝරා ගෙන ඇත්තේත් ගංගා ආශ්‍රිත ප්‍රදේශ බව පැහැදිලි කර ඇත. මේ බව මහාවංශයේ එන තොරතුරුවලට අමතරව ශිලා ලේඛන (සෙල්ලිපි) ලැබී ඇති ස්ථාන පරීක්ෂාවෙන් ද නිගමනය කළ හැකි ය. මුලින් තම්බපණ්ණි නගරය ද, දෙවනුව උපතිස්ස නගරය ද, අනුරාධපුරය ද දියුණු නගර බවට පත් විය. තම්බපණ්ණි නගරය මල්වතු ඔය ආශ්‍රිතව ද, එහි ශාඛාවක් වූ කණදරා ඔය අසබඩ උපතිස්ස ග්‍රාමය ද පිහිටා තිබේ. කලාඔයේ මෝය අසල උරුවෙලා නගරය පිහිටා ඇත. උදේනි ගම කුමන ස්ථානයක පිහිටා තිබෙන්නට ඇත් දැයි දැනට ඇති සාධක මගින් තහවුරු කර ගත නො හැකි වී ඇතත් එය ගංගාවක් ආශ්‍රිත ව පිහිටන්නට ඇතැ'යි සිතිය හැකි ය. දැනට ලැබී ඇති සෙල්ලිපි වැඩි ප්‍රමාණයක් මල්වතු ඔය, කලා ඔය, ඇදුරු ඔය හා මහ ඔය යන ප්‍රදේශවලින් ලැබී ඇති බැවින් මේ ප්‍රදේශවල මුල් ආර්යයන් ජනපද පිහිටුවා ගන්නට ඇතැ'යි යන්න ස්ථිර වේ. මුල් ආර්යයන් රට ඇතුළට ගමන් කර ඇත්තේ මේ ඔයවල් දිගේ යැ'යි පැහැදිලි වේ.

**පද බෙදීම** **(ලකුණු 04යි)**
**විරාම ලක්ෂණ** **(ලකුණු 03යි)**
**(ලකුණු 07යි)**

(ii) සංක්‍රමණය
මහා වංශයේ, තම්බපණ්ණි
පරීක්ෂාවෙන්, ශිලා ලේඛන, සෙල්ලිපි, සාධක
ආශ්‍රිත **(ලකුණු 02යි)**

(iii) කොම්බුව හා ඇලපිල්ල, කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල/ඇදය **(ලකුණු 02යි)**

(iv) ආශ්‍රිත **(ලකුණු 02යි)**

(v) අර්ථාන්තර
වර්ගාක්ෂර
සවර්ණමාලි
සවර්ගමෝක්ෂ
අර්ථශාස්ත්‍රය
මාර්ගාසන්න
අධිස්වර **(ලකුණු 02 යි)**

**(ලකුණු 15යි)**